# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,472 — 1958 අගෝස්තු 11 වැනි සඳුද — 11.8.1958**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

සී 275 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය **අතිරේක ආහාර ද්‍රව්‍ය**

**1950 අංක 29 දරණ මිල පාලන පනත**

**නියෝගය**

(ආහාර) මිළ පාලක තැන්පත් කොටුවේ මුහන්දිරම් ධර්මසේන ජයනෙත්ති වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් (ආහාර) මිළ පාලක තැන කෙරෙහි පැවරී තිබෙන බලතල අනුව—

(1) පහත සඳහන් ආහාර මිළ නියෝග අද දින සිට මෙයින් අවලංගු කරමි—

(අ) 1958 මැයි මස 31 වැනි දිනය හා 11,332 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1958 මැයි 30 වැනි දිනය හා සී 269 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.

(ආ) 1958 ජූලි මස 4 වෙනි දිනය හා 11,411 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරණ ලද 1958 ජූලි මස 3 වැනි දිනය හා සී 273 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය, පිටරටින් මෙරටට බඩු ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දැන් පටන්, මේ උප ලේඛනයේ 2 වැනි, 3 වැනි හා 4 වැනි තීරවල අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) උප ලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

මෙම නියෝග්යෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සැම ප්‍රදේශයකම, උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සැම ප්‍රදේශයක ම යම් ස්ථානයක හෝ යම් වාහනයක උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සැම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා — "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව ද නියම කරමි.


2247—ජේ. ඇන්. ආර් 25490—4,000 (8/58)

(7) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරණු ලැබූ සැම ප්‍රදේශයක ම, උප ලේඛනයේ I වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සැම තැනැත්තකු හා උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සැම තැනැත්තකු විසින් ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දියයුතු බව ද නියම කරමි.

(8) උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිලත්, උප ලේඛනයේ 2 වැනි, 3 වැනි, 4 වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බව ද නියම කරමි.

1958 අගෝස්තු මස 11 වැනි දින පූ. භා. 11 ට කොළඹ දී අත්සන් කරණ ලදී.

ධර්මසේන ජයනෙත්ති,
(ආහාර) මිළ පාලක තැන.

## උපලේඛනය

| 1 වැනි තීරය<br>විස්තර | 2 වැනි තීරය<br>පිටරටින් බඩු ගෙන්වන්නෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 4 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| එළුණු (රතුළුණු හැර වෙනත් සියළුම) ... | 19 0 | 20 0 | 0 22 |
| කොත්තමල්ලි ... ... | 39 0 | 40 0 | 0 40 |
| සූදුරු ... ... | 117 0 | 118 0 | 1 20 |
| වියලි මිරිස් ... ... | 74 0 | 75 0 | 0 75 |
| මුං ඇට ... ... | 44 0 | 45 0 | 0 45 |
| උළුඳු (පියලි නොකළ) ... | 45 76 | 46 76 | 0 47 |
| කඩල පරිප්පු ... ... | 38 79 | 39 79 | 0 40 |
| මයිසූර් පරිප්පු ... ... | 59 0 | 60 0 | 0 60 |
| රතුළුණු ... ... | 24 0 | 25 0 | 0 28 |
| අර්තාපල් ... ... | 28 0 | 29 0 | 0 31 |
| උම්බලකඩ ... ... | 245 0 | 250 0 | 2 50 |
| අබ ... ... ... | 69 0 | 70 0 | 0 70 |
| ලුනු ... ... ... | — | — | 0 06 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන් ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

---

වී. 49 අංකය දරණ මිළ නියෝගය. අතිරේක ආහාර ද්‍රව්‍ය.

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

වවුනියා දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන්පත් සෙල්ලප්පා සින්නතම්බි වන මම 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4වැනි සහ 3 (2) යන කොටස් වලින් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 ජූලි මස 19 වෙනි දින අංක 11,432 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1958 ජූලි 17 වෙනි දින වී 48 දරණ ආහාර මිළ නියෝගයේ 2 සිට 5 දක්වා තීරයන්හි උළුඳු (පියලි නොකළ) කඩල පරිප්පු සහ මයිසූර් පරිප්පු පිළිබඳව 1වෙනි උප ලේඛනයේ සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි ;

(2) මීට යාකර ඇති පළමුවෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද වවුනියා දිස්ත්‍රික්කයේ විකිණිය හැකි වැඩිම මිළ මේ දුන් පටන් එම උප ලේඛනවල 2 සිට 5 දක්වා ඇති තීරවල සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

1958 අගෝස්තු මස 8වෙනි දින පෙ.ව. 9ට වවුනියා කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇස්. සින්නතම්බි,
වවුනියා දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන.

## උප ලේඛනය

| නො. | විස්තර (1වැනි තීරය) | දෙවැනි තීරය | | තුන්වැනි තීරය | | 4වැනි තීරය | | 5වැනි තීරය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වවුනියාව, පූදූකුලම, ආසිකුලම්, කල්ලිකුලම්, ඉරට් පෙරියකුලම්, වඩුකන්ද සහ නෙදූන්කුලම් | | පාවට්කුලම්, මරදමඩුව, රාසේන්දිරන්කුලම, සුදු වැන්දපුලවු, මාමඩුව, උළුකුලම, වලෙයිවයිත කුලම්, වෙඩ්ඩිකුලම්, කප්පුවච්, පලයවඩි අනන්තර් පුලියන්කුලම්, කනගරායන්කුලම්, මාන්කුලම්, ඕලුමඩු, මරතෝඩායි, නෙදූන්කර්නි, පලම්පායි | | මුලතිව් සහ වෙල්ලමුල් වයික්කාල් | | කරුපඩඩයි මූරිප්පු, කච්චිලාමඩු, අම්පලවන් පෙක්කාඩි, පුතුකුඩු ඉරිප්පු, කුමුලමුනෙයි, තන්නියුත්තු, මූලිය වලෙයි, කොක්කුකොඩු වායි, කෝකිලායි | |
| | | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 1. | උළුඳු (පියලි නොකළ) ... | 49 0 ... | 0 49 ... | 50 50 ... | 0 50 ... | 52 0 ... | 0 51 ... | 53 50 ... | 0 52 |
| 2. | කඩල පරිප්පු ... | 44 0 ... | 0 44 ... | 45 50 ... | 0 45 ... | 47 0 ... | 0 46 ... | 48 50 ... | 0 47 |
| 3. | මයිසූර් පරිප්පු ... | 56 50 ... | 0 56 ... | 58 0 ... | 0 57 ... | 59 50 ... | 0 58 ... | 61 0 ... | 0 59 |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.